චක්‍රලේඛ අංක:- 06/2005

මගේ අංකය:- බප/සසේකො/ලේ/නිර්
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත,
අංක 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2005.05.13

බස්නාහිර පළාතේ
සියලුම විවිධ සේවා සමුපකාර සමිති,
සභාපතිවරුන් වෙත,

## ජ්‍යෙෂ්ඨ කළමණාකරන මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීම

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී, ගණකාධිකාරී, අභ්‍යන්තර විගණන, වාණිජ කළමණාකරු, බැංකු සේවා කළමණාකරු, පරිපාලන කළමණාකරු, මානව සම්පත් කළමණාකරු, පරිපාලන නිලධාරී, පිරිස් කළමණාකරු, ~~බැංකු සේවා කළමණාකරු~~, සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරී ආදී ජ්‍යෙෂ්ඨ තනතුරුවලට බාහිරින් සුදුස්සන් බඳවා ගැනීමේදී පවත්නා දුෂ්කරතාවය නොයෙක් අවස්ථාවලදී සමිති විසින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරනු ලැබ ඇත.

02. එබැවින් දැනට පවත්නා බඳවා ගැනීමේ පටිපාටි සහ වැටුප් ක්‍රම පිළිබඳව සමාලෝචනයක් කොට එම නිර්දේශයන් ඉදිරිපත් කිරීමට පෙරාතුව අතුරු පූරක පියවරක් වශයෙන් මෙම තනතුරු සඳහා බාහිරින් බඳවා ගන්නා පුද්ගලයන් වෙනුවෙන් අනුමත වැටුප් ක්‍රමයේ කිසියම් මධ්‍ය වැටුප් පියවරක පිහිටුවා වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ඔවුන් ගේ සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බලා තීරණය කිරීමට සම්මුඛ පරීක්ෂණවලදී ඔවුන් විසින් ඉල්ලා සිටින වැටුප සහ ඔවුන් ගේ සුදුසුකම් පිළිබඳව පිළිගත හැකි සියළු තොරතුරු කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් සුදුසු වැටුප් පියවරක් තීරණය කිරීමට කොමිෂන් සභාව ක්‍රියා කරනු ඇත. එබැවින් මින් ඉදිරියට තනතුරු සඳහා දැන්වීම් පළ කිරීමේදී එම දැන්වීම්වල බාහිර අපේක්ෂකයන් සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සලකා බැලීමෙන් අනතුරුව සුදුසු වැටුප් පියවරක් තීරණය කරනු ලැබිය හැකි බව සඳහන් කිරීමට පියවර ගන්නා ලෙස ද කොමිෂන් සභාවේ නියමය පරිදි මෙයින් දැනුම් දෙමි.

03. බාහිර අයදුම්කරුවන් ලෙසින් වෙනත් සමුපකාර සමිතිවලින් ඉදිරිපත් වන අයදුම්කරුවන්ට මෙය අදාල නොවේ.

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:-
1. බස්නාහිර පළාත් සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍ය තුමා ගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම් - සමුපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය (බ.ප.)